කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# ඉතිහාසය
(I කොටස)

08 වන ශ්‍රේණිය

මිනිත්තු 30
Thirty minutes

නම/ විභාග අංකය .......................................................

❋ පළමු කොටසේ සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

❋ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ක්‍රි. ව 1798 - 1802 දක්වා ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල සිදු වූ ද්විත්ව පාලනය යනු,
(1) වෙළෙඳ සමාගමේ පාලනය හා රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා අතර පාලනයයි.
(2) බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමත්, බ්‍රිතාන්‍ය රජයත් විසිකන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ හවුල් පාලනය කිරීමයි.
(3) බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ සම්පූර්ණ පාලනයට යටත්වීමයි.
(4) ක්‍රි. ව. 1798 - 1802 දක්වා ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයාගේ පාලනයට යටත්වීමයි.

(02) උඩරට රාජධානියේ පළමු රජු ලෙස සඳහන් වන්නේ,
(1) සේනා සම්මත වික්‍රමබාහු රජු
(2) කරලියද්දේ බණ්ඩාර රජු
(3) පළමුවන විමලධර්මසූරිය රජු
(4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු

(03) ක්‍රි.ව. 1505 දී පෘතුග්‍රීසින් ලංකාවේ මුහුදු බඩ පළාත් වලට පැමිනෙන විට ශ්‍රී ලංකාව බෙදා තිබුණු පාලන මධ්‍යස්ථාන තුන වන්නේ,
(1) කෝට්ටේ, කන්ද උඩරට, යාපනය
(2) කොට්ටේ, සිතාවක, කන්ද උඩරට
(3) කන්ද උඩරට, යාපනය, රයිගම
(4) කෝට්ටේ, රයිගම, සීතාවක

(04) ඔහුගේ නව සොයා ගැනීම් තාරකා හා ග්‍රහලෝක පිළිබඳ විද්‍යානුකූල අධ්‍යයනයකට මඟ හෙළි කළේය. මොහුගෙන් විද්‍යාවට සිදු වූ මහත් සේවය නිසා "තාරකා විද්‍යාවේ පියා" වශයෙන් ද හැඳින්විය. ඉහත ප්‍රකාශනය හා සම්බන්ධ වන්නේ,
(1) ගැලීලියෝ ගැලිලි ය.
(2) අයිසෙක් නිව්ටන් ය.
(3) නිකලස් කොපර්නිකස් ය.
(4) මයිකල් පැරඩේ ය.

(05) I විමලධර්මසූරිය රජතුමාගේ කාලයේදී දෝන කතිරිනා කුමරිය උඩරට රැජින ලෙස පත් කිරීමේ අපේක්ෂාවෙන් උඩරටට යැවූ පෘතුග්‍රීසි සේනාවේ නායකයා වූයේ,
(1) දෙන් ජෙරනිමෝද අසවේදු
(2) ද ලසර්ද
(3) දියෝ ගෝද මේලෝද කස්ත්‍රෝ
(4) පේරෝ ලොපෙස් ද සූසා

* අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(06) පෘතුග්‍රීසින් ශාන්ත ලෝරන්ස් නගරය යන නමින් හැඳින් වූයේ කොළොම්පුරයටය. ( )

(07) ක්‍රි. ව. 1602 දී උඩරට රජු හමු වීමට පැමිණි පළමු ලන්දේසි දූතයා වූයේ සීබෝල්ට් ද වාර්ට්ය. ( )

(08) කිර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ කාලයේදී බුරුමයෙන් උපසම්පදාව සඳහා භික්ෂූන් වහන්සේලා වැඩමවා ඇත. ( )

(09) මධ්‍යයතන යුගයේ කලාශිල්ප හැඩ ගැසී තිබුණේ පල්ලියේ අනුග්‍රහය මත ආගමික චින්තනය පදනම් කරගෙනය. ( )

(10) ලියනා ඩෝ ඩාවින්චි ෆ්ලෝරන්ස් නගරයේ ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පියකු වූ වෙරෝකියෝ යටතේ චිත්‍ර කලාව හැදෑරිය.

* **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල A තිරුවේ දක්වා ඇති වාක්‍යංශ වලට ගැලපෙන කරුණු B තිරුවෙන් තෝරා ඊට අදාළව අක්ෂර ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

| | A | | | B |
|---|---|---|---|---|
| (11) | ද්විත්ව රුධිර සංසරණය පද්ධතිය සොයා ගැනීම. | ( ) | A. | අයිසෙක් නිව්ටන් |
| (12) | ගුරුත්වාකර්ෂණ බලය සොයා ගැනීම | ( ) | B. | බතාවියා |
| (13) | මානව වාදයේ පියා | ( ) | C. | විලියම් හාවේ |
| (14) | ලන්දේසින්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය | ( ) | D. | ගෝවා |
| (15) | පෘතුග්‍රීසින්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය | ( ) | E. | පෙට්රාක් |
| | | | F. | මදුරාසිය |

* **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල දී ඇති හිස්තැනට සුදුසු පදය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(16) පුනරුද සමයේ දේශපාලන ක්ෂෙත්‍රයේ සිදු වූ වැදගත් ම නවෝදය වූයේ ................................................ බිහිවීමයි.

(17) ක්‍රි ව 1638 දී දෙවන රාජසිංහ රජතුමා සහ ................................................ නැමැති ලන්දේසි නායකයා අතර ගිවිසුමක් අත්සන් කළහ.

(18) ක්‍රි. ව. 1557 දී ධර්මපාල කුමරු ................................................ නමින් බෞතිස්ම ලැබීය.

(19) සීතාවක මායා දුන්නේ රජු පෘතුග්‍රීසින්ට එරෙහිව දියත් කළ සටන් වලදී ඔහුගේ පුත් ................................................ පෙරමුණ ගත්තේය.

(20) අතීතයේදී යාපන රාජධානියේ අගනගරය වූයේ ................................................ ය.

කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# ඉතිහාසය
(II කොටස )

08 වන ශ්‍රේණිය

පැය 01 මිනිත්තු 30
Thirty minutes

නම/ විභාග අංකය ..........................................................

- I වන ප්‍රශ්නය අනිවාර්යයි.
- තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි

(01) (i) දෙවන වාර අවසානයේ පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල යටතේ ඔබ පන්තියේ සිසුන් යෙදුණු ප්‍රායෝගික ක්‍රියාකාරකම නම් කරන්න.
(ලකුණු 01)

(ii) එම ක්‍රියාකාරකම ඉටු කිරීමට ප්‍රථම ඔබගේ ගුරුතුමා,/ගුරුතුමිය ඔබ පන්තියට ලබා දුන් උපදෙස් දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 02)

(iii) මෙම ක්‍රියාකාරකම සඳහා ඔබ කණ්ඩායමට ලැබුණු මාතෘකාව ලියන්න.
(ලකුණු 02)

(iv) ඔබ එම මාතෘකාව තුළින් සැදූ ප්‍රශ්න දෙකක් සහ ඊට අදාළ පිළිතුරු දෙක සඳහන් කරන්න.
(ලකුණු 02)

(v) මෙම ක්‍රියාකාරකම ඉටුකිරීමේදී ඔබ කණ්ඩායම මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න.
(ලකුණු 02)

(vi) වඩාත් ආකර්ශණීය ලෙස ඇගයීම ගුරුතුමාට / ගුරුතුමියට බාර දීම සඳහා නිමා කිරීමට ඔබ කණ්ඩායම අනුගමනය කළ ක්‍රමවේද තුනක් ලියන්න.
(ලකුණු 03)

(vii) මෙවැනි කණ්ඩායම් ක්‍රියාකාරකම් වල යෙදීමෙන් ඔබ ලබාගත් ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.
(ලකුණු 04)

(02) (i) උඩරට රාජධානිය අතීතයේදී හැඳින්වූ නම් දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 02)

(ii) දෙවන රාජසිංහ රජතුමා පෘතුග්‍රීසීන් එලවා දැමීමේ අභිමතාර්ථය සාර්ථක කොට ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න.
(ලකුණු 04)

(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු නායක්කාර් වාංශික රජ කෙනෙකු වුවද බුදු දහමේ දියුණුවට ඉටුකළ සේවාවන් දෙකක් සඳහන් කර විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) උඩරට රාජධානියේ රජ කළ නායක්කාර් වාංශික රජවරු දෙදෙනෙක් නම් කරන්න.
(ලකුණු 02)

(ii) පළමුවන විමලධර්මසූරිය රජුගෙන් ඉටු වූ ආගමික සේවාවන් හතරක් ලියන්න.
(ලකුණු 04)

(iii) ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමාට උඩරට තෙපිරිසගේ සහාය නොලැබීමට හේතු දෙකක් සඳහන් කර විස්තර කරන්න.
(ලකුණු 05)

(04) (i) නව මුහුදු මාර්ග සෙවීමට යුරෝපීය ජාතීන් පෙළඹවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 02)

(ii) කොන්ස්තන්තිනෝපල් නගරයේ වැදගත්කම පිළිබඳ කරුණු හතරක් සඳහන් කරන්න.
(ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ පෘතුග්‍රීසින් යටතේ සිදුවූ ආර්ථික හා සමාජ සංස්කෘතික වෙනස් කම් දෙකක් සඳහන් කර විස්තර කරන්න.
(ලකුණු 05)

(05) පහත සඳහන් සටන් හා සම්බන්ධ රජවරුන් කවුරුන්දැයි නම් කරන්න.

(i) A - මුල්ලේරියා සටන
B - දන්තුරේ සටන
(ලකුණු 04)

(ii) ක්‍රි. ව. 1521 දී ඇරඹි සීතාවක රාජධානියේ බලය වර්ධනය වීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න.
(ලකුණු 04)

(iii) පෘතුග්‍රීසි පාලනය සමයේදී උඩරට රාජධානිය සමඟ ඇතිකරගත් සටන් 2ක් ලියා, ඒ පිළිබඳව විස්තර ලියන්න.
(ලකුණු 05)

(06) (i) පෘතුග්‍රීසින් පැමිණෙන විට ලංකාවේ ප්‍රධාන පාලන මධ්‍යස්ථාන දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 02)

(ii) පෘතුග්‍රීසින් යාපනය කෙරෙහි සිත් යොමු කිරීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ කතෝලික දහම පතුරුවා හැරීම සඳහා පෘතුග්‍රීසිහු මහත් වෙහෙසක් දැරූහ. ඒ බව කරුණු දෙකක් සඳහන් කර විස්තර කරන්න.
(ලකුණු 05)

(07) යුරෝපීය පුනරුද යුගයේ දියුණු වූ අංශයකි ශාස්ත්‍රීය පුනරුදය.
(i) කලා ක්ෂේත්‍රයේ පිබිදීම යටතේ එකල ජීවත් වූ කලාකරුවන් දෙදෙනෙක් නම් කරන්න.
(ලකුණු 04)

(ii) චින්තන විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස පාප් වහන්සේලා පවා කලාකරුවන්ට අනුග්‍රහය දක්වා ඇත. එවැනි පාප් වහන්සේලා හතර දෙනෙක් නම් කරන්න.
(ලකුණු 04)

(iii) පුනරුදය නිසා ඇති වූ නව විද්‍යාත්මක සොයා ගැනීම් වලට උදාහරණ 2ක් දෙමින් විද්‍යා අංගයේ සිදුවූ පිබිදීම පිළිබඳ විස්තර කරන්න.
(ලකුණු 05)